**කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම - 2023**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය**

කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**අවධාරණය කරනු ලබන කරුණ**

මගේ මතයට බලපෑමක් සිදු නොකර, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය, මූල්‍ය ප්‍රකාශනවල 2.5 සටහන වෙත අවධානය යොමු කරමි. එම සටහනේ දක්වා ඇති පරිදි, සමාගමේ කළමනාකාරීත්වය සමාගමට සහ එහි අනුබද්ධිත සමාගම්වල අඛණ්ඩ පැවැත්ම පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි නුදුරු අනාගතයේ දී ව්‍යාපාර කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත් වේ. තවද සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් කළමනාකාරීත්වය හඳුනාගෙන නැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

කෙසේ වෙතත්, හෙලන්කෝ හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 වර්ෂයේ දී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ හෝටල් ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත. අපේක්ෂා කරන ලද ඉදිරි අනාගතයේදී සමාගම ඈවර කිරීමට සමාගම විසින් තීරණය කර නොමැත. එබැවින්, සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත ඉදිරි කාලය සඳහා ද පිළියෙල කරනු ඇත.

තවද, සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමෙ හි කළමනාකාරීත්වය සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර නුදුරු අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍යය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත් වේ. තවද, සමාගමට අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකරණය හඳුනාගෙන නැත. මීට අමතරව, 2020 ජූලි 10 දිනැති අංක 20/1042/204/050-I අමාත්‍ය මණ්ඩල ප්‍රතිකාව මඟින් ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතියේ ඉදිරිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත. කෙසේ නමුත්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2022 මැයි 30 දින සිට බලපැවැත්වෙන පරිදි, මාස නවයක කාලපරිච්ඡේදයක් සඳහා පරිමාණය අඩු කිරීමක් සහිතව ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට නිශ්චය කර තිබුණු අතර වාර්තා කරන දින වන විටත් ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.

තවද, 2023 මාර්තු 13 දින කැබිනට් අමාත්‍යවරුන් විසින් ඔවුන්ගේ රැස්වීමකදී, අනෙකුත් රජය සතු ව්‍යවසායයන් අතරින් කැන්විල් හෝල්ඩින්ස්හි ආයෝජන ඉවත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම වෙනුවෙන් අංක MF/018/2023/055 දරන කැබිනට් සංදේශය සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එකී ආයෝජන ඉවත් කර ගැනීමේ වැඩසටහන ආරම්භ කර තිබුණු අතර අභිලාෂය ප්‍රකාශ කිරීම (EOI) සම්බන්ධ ක්‍රියාවලිය දැනටමත් සම්පූර්ණ කර තිබුණි.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේදී පරිපාලිත සමාගමක් වන හෙලංකො හොටෙල්ස් සහ ස්පා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් හම්බන්තොට ප්‍රදේශයේ හෝටලය ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියට අදාළ හෝටලය ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. තවද, 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන කැබිනට් තීරණයට අනුකූලව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන කිරීමේ අමාත්‍යාංශය මගින් මව් සමාගම වන කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස් හිමිකාරීත්වයට අදාළ සමාගමේ කොටස මාරු කිරීම සඳහා ඔවුන්ගේ උපදෙස් ලබා දී තිබුණි. තව දුරටත්, 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරන කැබිනට් තීරණයට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ලිට්රෝ ගෑස් ලංකා සමාගම සතුව පවතින කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස්, මහා භාණ්ඩාගාරය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා දීම සඳහා කැබිනට් අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබා දී තිබුණි. මෙම වැඩසටහන වාර්තාකරණ දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය මගින් ආරම්භ කරන ලද වැඩසටහනක් හරහා ප්‍රමුඛතා පදනම යටතේ අනෙකුත් සමාගම් අතරින් මෙම සමාගමේ ආයෝජන ඉවත් කර ගැනීම සඳහා වර්තමානයේදී යෝජනා කර තිබෙන බව. | කැබිනට් අමාත්‍යවරුන්ගේ තීරණ ක්‍රියාත්මක කළ යුතුය. |
| සිනොලංකා හොටෙල්ස් සහ ස්පා පුද්ගලික සමාගමේ (පරිපාලිතය) කළමනාකාරීත්වය විසින් සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර තිබුණු අතර නුදුරු අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත්ව තිබුණි. තවදුරටත්, අඛණ්ඩ පැවැත්මක් ඇතිව ඉදිරියට කටයුතු කරගෙන යාමට සමාගමට ඇති හැකියාව පිළිබඳව සැළකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකරණය හඳුනාගෙන නොතිබුණි. 2020 ජූලි 08 දිනැති අංක 20/1092/204/050-1 මගින් ග්‍රෑන්ඩ් හයට් කළඹුබු ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කර තිබුණද 2022 මැයි 30 දින සිට බලපැවැත්වෙන පරිදි, මාස නවයක කාලපරිච්ඡේදයක් සඳහා පරිමාණය අඩු කිරීමක් සහිතව ග්‍රෑන්ඩ් හයට් කළඹුබු ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රජය මගින් නිකුත් කරන ලද මගපෙන්වීම් අනුගමනය කරමින් සමාගම විසින් නිකුත් කරන ලද මගපෙන්වීම් සමාගමේ කළමනාකාරීත්වය විසින් අනුගමනය කරන බැවින් වර්තමානයේදී රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගතකරන ඒකකය මගින් ආරම්භ කරන ලද යෝජිත ආයෝජන ඉවත් කර ගැනීමේ වැඩසටහනට අනුව කටයුතු සිදු කරමින් සිටින බව. | - එම - |

ඉදිරියට කරගෙන යාමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කර තිබුණු අතර වාර්තා කරන දින වන විටත් ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2007 අංක 07 දරන සමාගම් පනතේ 52 (3) වගන්තිය | ප්‍රතිෂ්ඨාව ලබා ගැනීමකින් තොරව, කොටසකට රු. 8.50 ක් බැගින් කොටස් 235,294,117 ක් නිකුත් කර තිබුණු අතර කොටස් නිකුතුව සමාගම් රෙජිස්ටාර්හි ලේඛන ගත කර තිබුණි. කෙසේ නමුත්, ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපුම් සිදු කර නොතිබුණි. එම නිසා, මූල්‍ය ප්‍රකාශන තුළ සහ සමාගම් රෙජිස්ටාර් සතුව පවතින වාර්තාවන් තුළ කොටස් ප්‍රාග්ධනය ලෙස පෙන්නුම් කරන අගයෙහි රු.බිලියන 2 ක වෙනසක් නිරීක්ෂණය විය. | සමාගම් රෙජිස්ටාර්හි පවතින කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සම්බන්ධයෙන් වූ මෙම කොටස් නිකුතුව යාවත්කාලීන කළ වාර්තා අවලංගු කිරීම සඳහා සමාගම කොටස් නැවත මිලදී ගැනීමේ ක්‍රියා පටිපාටියක් ආරම්භ කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින බව | සමාගම් පනතේ වගන්තිවලට අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,814,462 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.4,299,299 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,113,761 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සිනොලංකා හොටෙල් සහ ස්පා පුද්ගලික සමාගමේ විදේශ විනිමය පරිවර්තිත ලාභය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ආදායම්, පරිපාලන වියදම් සහ ශුද්ධ ලාභය / (පාඩුව) විචලතාවයන් සමග සසඳා ඉකුත් වර්ෂ 5 ක් සඳහා වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතය පහත පරිදි වේ.

| වර්ෂය | 2023 (රු.) | 2022 (රු.) | 2021 (රු.) | 2020 (රු.) | 2019 (රු.) |
|---|---|---|---|---|---|
| මූල්‍ය ආදායම | 307,870 | 1,627,095 | 16,009,682 | 1,225,668 | 9,435,080 |
| පරිපාලන වියදම් | (5,962,278) | (7,753,562) | (9,411,210) | (6,540,697) | (9,931,740) |
| බදු පසු ශුද්ධ ලාභය/ (පාඩුව) | 3,814,462 | (4,299,299) | 5,008,966 | (4,076,470) | (255,178) |

## 2.3 අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශනවලට අනුව සහ විගණනය වෙත ලැබුණු තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඉතා වැදගත් අනුපාතයන් කිහිපයක් පෙර වර්ෂය සමඟ සසඳා පහතින් දක්වා ඇත.

| අනුපාතයන් | 2023 % | 2022 % | 2021 % | 2020 % | 2019 % | 2018 % |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය ආදායම්වල වර්ධනය/ (පිරිහීම) ප්‍රතිශතයක් ලෙස | (81) | (90) | 1206 | 87 | (63) | (33) |
| පරිපාලන වියදම්වල වර්ධනය/ (පිරිහීම) ප්‍රතිශතයක් ලෙස | (23) | (18) | 44 | 34 | 14 | 11 |
| ශුද්ධ ලාභයේ වර්ධනය/ (පිරිහීම) ප්‍රතිශතයක් ලෙස | 189 | (186) | (223) | 1498 | (101) | (89) |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1. සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය ආවරණය කෙරෙන කාලපරිච්ඡේදයට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ඉදිරි වැඩපිළිවෙල තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් එවැනි සැලසුම් මුලපිරීම් ක්‍රියාත්මක කළ හැකි වනු ඇති බව සමාගමේ කළමනාකාරීත්වයේ අදහස බව. | සංයුක්ත සැලැස්ම පිළියෙල කර එහි උපායමාර්ගික අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ඉදිරි වැඩපිළිවෙල තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් එවැනි සැලසුම් මුලපිරීම් ක්‍රියාත්මක කළ හැකි වනු ඇති බව සමාගමේ කළමනාකාරීත්වයේ අදහස බව. | වර්ෂයේ ආරම්භයේදී සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අනුමත කර ගත යුතු අතර එහි වාර්ෂික ඉලක්කයන් සපුරාලීම සඳහා ක්‍රියාත්මක කළ යුතුය. |